# ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂය සම්බන්ධයෙන් දරන ආකල්ප

පී.ඩී. ගෝතමී දිල්හාරා[1]

බොහෝ සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර විෂයන් නූතන සමාජ ක්‍රමය තුළ අවතක්සේරුවට ලක්වීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර පුරාවිද්‍යා විෂය ද එම ගැටළුවට මුහුණපා ඇත. පුරාවිද්‍යා විෂය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් දරන ආකල්පයන් හැදෑරීමෙන් මෙම ගැටළුවට පාදක වන මූලික කරුණු හඳුනාගත හැකි ද යන අපේක්ෂාවෙන් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙහිදී අහඹු නියැදිය ලෙස තෝරාගනු ලැබුවේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පළමු වසර විද්‍යාර්ථීන් 50 ක පිරිසකි. ඔවුන්ට ප්‍රශ්ණාවලියක් ඉදිරිපත් කරනු ලැබූ අතර, එම ප්‍රතිචාර මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ප්‍රශ්ණාවලියට දෙන ලද ප්‍රතිචාර ඔස්සේ කාණ්ඩ කිහිපයක් හඳුනාගත හැකිය. මොවුන් අතුරින් පළමු කාණ්ඩය පුරාවිද්‍යාවට ප්‍රිය කරන පිරිසයි. ඔවුන්ගේ මතයට අනුව ප්‍රායෝගික හා න්‍යායාත්මක අතීත කරුණු හෙළිකරනු ලබන විද්‍යාත්මක මෙන්ම විනෝදකාමී විෂයක් බැවින් ඔවුන් පුරාවිද්‍යාව තෝරාගෙන ඇත. මෙම පිරිස 48%ක ප්‍රතිශතයක් ලෙස දක්වේ. අනෙක් පිරිස පුරාවිද්‍යාව හොඳ විෂයක් ලෙස පැවසුව ද ඔවුන් විෂය තෝරාගෙන නොමැත. එම පිරිස 32%කි. අනෙක් කොටස විෂය තෝරාගෙන පසුව ඉවක් වී ඇත. ඔවුන් 20%කි. ඒ අනුව 52%ක ප්‍රතිශතයක් පුරාවිද්‍යා විෂය ප්‍රතික්ෂේප කර ඇති බව පැහැදිලිය. මෙසේ වීමට මූලිකම හේතුව වී ඇත්තේ බාහිර සමාජයෙන් ඔවුන්ට අසන්නට ලැබෙන කටකතාවන්ය. නවීණ ලෝකයේ වානිජකරණයත් සමග බොහෝ දෙනා පෙළඹෙන්නේ නවීණ විෂයන් හැදෑරීමටය. එම නිසා යල් පැනගිය විෂයක් ලෙස ඔවුන් පුරාවිද්‍යාව පිළිබඳ මතයක් දරා සිටී. අනාගත රැකියාව පිළිබඳ ඔවුනට ගැටළුවක් පවතී. එය පැන නැගෙන්නේ ඔවුනගේ නොදැනුවත්කම ද නැතිනම් සමාජ බලපෑම ද යන්න ගැටලුවකි. මෙහි ප්‍රායෝගික මට්ටම වැඩි බැවින් ප්‍රායෝගික මට්ටමේ රැකියා දැකගත හැකිය. ඇතැමුන් විෂයේ පවතින බාහිර ක්‍රියාකාරකම් හේතුවෙන් කාර්‍යබහුලත්වය නිසා විෂය ප්‍රතික්ෂේප කරයි. ඒකාකාරී න්‍යාය මත පදනම් වූ පාසල් අධ්‍යාපනයෙන් මිදී විශ්වවිද්‍යාලයට පිවිසෙන්නේ උපාධියක් ලබාගැනීම අරමුණු කරගෙනය. කලා විෂයන් ධාරාව අතර සෞන්දර්ය විෂයන් කිහිපය හැර අනෙක් විෂයන් අයත්වන්නේ න්‍යාය මත පදනම් වූ විෂයන් නිසා ඉන් මිදී ප්‍රායෝගික විෂයක් කිරීමට මොවුන් නොපෙළඹෙයි. එම නිසා බොහෝ දෙනා පුරාවිද්‍යාව ප්‍රතික්ෂේප කිරීමට හේතුව වී ඇත. ඉතිහාසය හා පුරාවිද්‍යා විෂයයන් දෙකම එකම කුලකයේ පැවතිය ද, ඉතිහාස න්‍යායාත්මක පදනම්වීමත් නිසා බොහෝ පිරිස ඉතිහාස විෂය තෝරා ගනී. ඒ අනුව සැලකිය යුත්තේ පාසල් අධ්‍යාපනය තුළ පුරාවිද්‍යාවට යම් තැනක් දීමත්, පුරාවිද්‍යා විෂය නවීන ලෝකයට ගැළපෙන ලෙස වෙනස්කම් සහිතව ඉදිරියට පවත්වාගෙන යෑමට අවශ්‍ය කරන ජාතික ප්‍රතිපත්තිමය සහ පර්යේෂණමය පියවර ගතයුතු බවත් මෙම අධ්‍යයනයට අනුව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : විශ්වවිද්‍යාල සිසුන්, පුරාවිද්‍යා විෂය, ප්‍රතිශතමය, අහඹු නියැදි

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.dilharagothami@gmail.com